# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## හේෂා මිත්‍රත්ව පදනම
## (සංස්ථාගත කිරීමේ)

**හේෂා මිත්‍රත්ව පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා විසින්
2017 ඔක්තෝබර් මස 20 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ඔක්තෝබර් මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[214 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 17.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010401—260 (2017/10)

# හේෂා මිත්‍රත්ව පදනම
# (සංස්ථාගත කිරීමේ)

## හේෂා මිත්‍රත්ව පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“හේෂා මිත්‍රත්ව පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ පදනමේ, පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක      දරන හේෂා මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

හේෂා මිත්‍රත්ව පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) “හේෂා මිත්‍රත්ව පදනමේ” දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “හේෂා මිත්‍රත්ව පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද එය භාවිතා කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද එකී සංස්ථාව විසින් ද, විරුද්ධව ද, එයට එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පෙර පාසල් ළමුන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

2—PL 005442 -300 (2017/09)

(ආ) විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඇ) අධ්‍යාපන හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) ග්‍රාමීය ප්‍රදේශයන්හි පරිසර සංරක්ෂණයට අදාළ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඉ) ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටු කරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරිගැන්වීම;

(ඊ) විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන පිහිටුවීම ;

(උ) ළමුන්ගේ සහ කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා සමාජගත කිරීමේ වැඩසටහන්, අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහාය වීම ;

(ඌ) ජාති, ආගම් තුළ බේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම සඳහා ආධාර උපකාර කිරීම ;

(එ) පාසල් අධ්‍යාපනය අවසන් කරන ලද තරුණයන්ගේ කලා, ක්‍රීඩා සහ තාක්ෂණ දැනුම වැඩි දියුණු කිරීම සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා සහ අධ්‍යාපන පාඨමාලා ආරම්භ කිරීම;සහ

(ඒ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන එකොළොස්දෙනකුට නොවැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකරණ කමිටුවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත් ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුවේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනකට පෙරාතුව ම වූ දිනයේ සංවිධානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන්

සමන්විත විය යුතු අතර, එම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්, මෙම පනතේ 6 වැනි වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව නව කළමනාකරණ කමිටුවක් පත් කරන තෙක් ධුර දැරිය යුත්තේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් සහ පරිත්‍යාග භාරගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

පදනමේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම ඔවුන්ගේ බලතල, චර්යාව සහ වගකීම ;

(ඇ) කළමනාකරණ කමිටුවෙ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ එහි බලතල, කාර්යය, චර්යාව සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලයන් ;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය, කර්තව්‍ය සහ බලතල ;

(ඉ) කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, කාලවේලාවන්, ස්ථානයන්, එම රැස්වීම් පිළිබඳ දැන්වීම සහ න්‍යාය පත්‍ර, එම රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කාරණා;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ එකී අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයටම සහ එවැනිම වූ රැස්වීමක දී සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් සහ පදනමට අයවිය යුතු මුදල්.

**7.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සංවිධානයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංවිධානයට අයවිය යුතු සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, හෝ ආධාර මුදල් වශයෙන් මින් පෙර හෝ මින් මතු සියළු මුදල් සංස්ථාවේ අරමුදල් වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ බලතල, කාර්යය, හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, යම් තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ මේ පනතේ

විධිවිධාන සහ සංස්ථාවේ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත් ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම් සහ විගණනය.

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** සභාපති / කළමනාකාර අධ්‍යක්ෂවරයා හෝ කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් විසින් ඔවුන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිර ව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.